වරදක් නැත. පැල් ද එක් එක් පැත්තකට ඇල වෙන්ම පුළුවන. නමුත් එයින් ද කම් නැත.

පැල ඉන්දවීමේ කරදර කාරී ගතිය හැකි තාක් දුරට අඩුකර ගත යුතුයි. ගෙලුම් කවියකින් හෝ ගම්බද බෙරි—වාදනයකින් මේ භාරදූර කාර්‍ය්‍ය ප්‍රීතිමත් වැඩක් බවට පමුණුවා ගන්නට පුළුවන. 'අත්තම් ක්‍රමයට' 'කයියක්' දමා බත බුලතින් හෝ දුමෙන් සංග්‍රහ කොට සියලු දෙනද එකතු වී මාරුවෙන් මාරුවට තම තමන්ගේ කුඹුරුවල පැල ඉන්දවා ගන්නට පුරුදු වුවහොත් මේ භාරදූර වැඩේ ඉතා ලේසි පහසු වැඩක් බවට පත්වනු නොඅනුමාන ය මෙසේ සාමූහිකව පැල ඉන්දවීමේ දී, ඉන්දවන ප්‍රථම කුඹුර උත්සව සිරියෙන් ආරම්භ කළ හැකියි. අවසාන කුඹුරත්, වැඩය සමාරවීමේ පිං දීමකින් කෙළවර කළ හැකියි පැල ඉන්දවීම ලෙහෙසි පහසු කරවීමේ හැම ක්‍රමයක්ම විදහා දැක්වීම දුෂ්කරය එතකුදු වුවත් ලංකාවේ කෘෂිකර්මාන්තයට අදාළ වූ ඉතා වැදගත් කටයුත්තක් වන මේ පැළ ඉන්වීමට විරුද්ධව ඇති එක් බලවත් කරුණක් ඒ සඳහා යොදන්නට සිදුවන පිරිස හෙයින්, මෙය හැම කෙනෙකුගේම සමීප සැල—කිල්ලට භාජනය විය යුතුයි. පැල ඉන්දවීමේ කාර්‍ය්‍ය පහසු කර ගැනීමේ ක්‍රියාත්මක මාර්ග ගැන සිතා බලා අත්හදා බලා ප්‍රසිද්ධියට පැමිණවීම අපගේ පරමාර්ථ—ය යි.

(ලබන කලාපය බලනු)

## අපේ ආහාර වියදම!

(ලංකාවට පිටරටින් ගෙන්වන ලද ද්‍රව්‍ය)

| | | ජනවාරි | පෙබරවාරි | මාර්තු |
|---|---|---|---|---|
| හාල් | හොං: | 345000 | 850000 | 1521000 |
| බාර්ලි | ,, | 1500 | 1000 | 200 |
| බෝංචි | ,, | — | — | — |
| කඩල | ,, | 30900 | 40100 | 73000 |
| කිරිඟු | ,, | 1400 | — | — |
| කිරිඟු පිටි | ,, | — | 203000 | 418000 |
| බිස්කට් | ,, | 88000 | 259000 | 9500 |
| බටර් | රා: | 3580 | 8200 | 131000 |
| කෝපි | රා: | 73300 | 300 | 303000 |
| සීනි කෑම | රා: | 53600 | 28500 | 4100 |
| ටින් කිරි | රා: | 1953000 | 1168000 | 408000 |
| වෙනත් කිරි වර්ග | රා: | 577000 | 239000 | 963000 |
| වියළි මිරිස් | හොං: | 15000 | 23700 | 23300 |
| වෙනත් තුනපහ | ,, | 25900 | 21200 | 21100 |
| කරවල | ,, | 52900 | 2900 | 63800 |
| උම්බලකඩ | ,, | 8300 | 4800 | 10600 |
| රතුලූනු | ,, | 34200 | 34600 | 97700 |
| අර්තාපල් | ,, | 16900 | 32300 | 28300 |
| සීනි | ,, | 231000 | 394000 | 21700 |




දැන් දැන්ම, කොටන්න! හාන්න!